## නන්දිමිත්‍ර ගැමුණු කුමරු රජකමින් පහකිරීමට තැත්කිරීම

අපට නැවතත් සරත් ෆොන්සේකා මහතා ගැන ලිවීමට සිදු වී ඇත. රනිල් වික්‍රමසිංහගේ ප්‍රධානත්වයෙන් පිහිටුවාගෙන ඇති ප්‍රභාකරන්ගේ මස්සිනාලාගේ පෙරමුණේ ඊනියා පොදු අපේක්‍ෂකයා ලෙස ෆොන්සේකා මහතා ඉදිරිපත් කිරීම එ පෙරමුණේ ඇතැමුන්ගේ දැනට ඇති වුවමනාව බව පැහැදිලි ය. එයට ජ වි පෙ හා දෙමළ ජාතික සංධානය ඇතුළත් කරගැනීමට ද ෆොන්සේකා මහතා පිහිටුවන සිහින ආණ්ඩුවක එ පක්‍ෂ දෙකේ කිහිප දෙනකුට ඇමතිකම් දීමට ද වික්‍රමසිංහ මහතා බලාපොරොත්තු වෙයි. එ අතර එම ආණ්ඩුවේ (විධායක?) අගමැතිකම තමාට හිමිවිය යුතු යැයි ද වික්‍රමසිංහ මහතා ප්‍රකාශයක් කර ඇත.

ජ වි පෙ තවමත් ප්‍රසිද්ධ දේශපාලනයෙහි පොදු අපේක්‍ෂකයකු ගැන කතාකරයි. එ සමග විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීමට වහාම අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතු බව ද එ පක්‍ෂය කියයි. ජ වි පෙ එමගින් කියන්නේ කුමක් ද යන්න පැහැදිලි නැත. එ කෙසේ වෙතත් එ පක්‍ෂය පොදු අපේක්‍ෂකයකු ගැන කතාකළ පළමු අවස්ථාව මෙය නොවන බව කාහටත් වඩා හොඳින් ජනාධිපතිතුමා හා පරිසර සංරක්‍ෂණය පිළිබඳ කටයුතු කරන ඇමතිවරයා දනිති. ඔවුන්ට එ පිළිබඳ ඇත්තේ දෙපැත්තක සිට ලැබූ අත්දැකීම් බව ද අමතක නොකළ යුතු ය. එමෙන් ම පොදු අපේක්‍ෂකයකු ගැන ජ වි පෙ ඉතිහාසයේ කටයුතු කර ඇති ආකාරයෙන් නම් පෙනී යන්නේ පොදු අපේක්‍ෂකයකු ඉදිරිපත් නොකිරීමට අවසානයේ දී එ පක්‍ෂය ක්‍රියාත්මක වී ඇති බව ය.

රනිල් වික්‍රමසිංහ මහතාට අනුව දෙමළ ජාතික සංධානය සරත් ෆොන්සේකා මහතා දෙමළ ප්‍රශ්නය පිළිබඳ දරන මතයට එකඟ විය යුතු ය. සරත් ෆොන්සේකා මහතාට අනුව මේ රට සිංහලයන්ගේ රට ය. අපට ඇති ප්‍රශ්නය සරත් ෆොන්සේකා මහතාගේ මතයට දෙමළ ජාතික සංධානය එකඟවන්නේ ද නැත් ද යන්න නො වේ. රනිල් වික්‍රමසිංහ මහතා එ මතය සමග එකඟ වන්නේ ද? තමා අගමැති වීමට බලාපොරොත්තුවන ආණ්ඩුවේ ජනාධිපතිවරයා බවට පත්කිරීමට යන තැනැත්තාගේ ප්‍රතිපත්ති සමග වික්‍රමසිංහ මහතා එකඟ වන්නේ ද?

පොදු අපේක්‍ෂකයා යම් අයුරකින් විධායක ජනාධිපති වුවහොත් (එ සඳහා විය සිදුරෙන් අහස බලන කණා කැස්බෑවාට එයට ඇති සම්භාවිතාවවත් නැති බව අමුතුවෙන් කිවයුතු නො වේ) හා ඔහු විධායක ජනාධිපති ක්‍රමය අහෝසි නොකිරීමට තීරණය කළහොත් හෝ එයට අවශ්‍ය තුනෙන් දෙකේ බලය රනිල් වික්‍රමසිංහ මහතා අගමැති වන්නේ යැයි සිතන ආණ්ඩුවට නොලැබුණහොත් එ මහතා කුමක් කරන්නේ ද? විධායක ජනාධිපතිවරයකු යටතේ අගමැතිකමක් කරන්නට වික්‍රමසිංහ මහතා සූදානම් ද?

එ ජා ප ප්‍රමුඛ ප්‍රභාකරන්ගේ මස්සිනාලාගේ සංධානය ජ වි පෙ ඇතිව හෝ නැතිව හෝ පොදු අපේක්‍ෂකයකු ඉදිරිපත් කරන්නේ නම් එහි දී මුලින් ම ඇත්තේ පොදු අපේක්‍ෂකයාට ජයගත නොහැකි බවට ඇති සහතිකය ය. මස්සිනාලාගේ සංධානයට රනිල් වික්‍රමසිංහ මහතා හෝ මහා වැඩකාරයකු ලෙස පෙනී සිටීමට උත්සාහ කරන එස් බී දිසානායක මහතා හෝ වෙනත් කිසිවකු හෝ ඉදිරිපත්කර ජයගත හැකිය යන බලාපොරොත්තුවවත් ඇතිකරගැනීමට හැකිනම් ඔවුන් කිසි දිනෙක ඊනියා පොදු අපේක්‍ෂකයකු ගැන කතා නොකරනු ඇත. පොදු අපේක්‍ෂකයකු ඉදිරිපත් කරන්නේ ම ඔහුට ජයගත නොහැකි බැවිනි.

සරත් ෆොන්සේකා මහතා පොදු අපේක්‍ෂකයා ලෙස ඉදිරිපත්කරන්නේ නම් එයට හේතුව ඔහුට ජයගතහැකිවීම නොව එක ගලෙන් කුරුල්ලන් දෙදෙනකු මරා ගැනීමට විජාතික බලවේගවලට හැකිවීම ය. වෙනත් පොදු අපේක්‍ෂකයකුට වඩා ඡන්ද ප්‍රමාණයක් ෆොන්සේකා මහතාට ලබාගත හැකි වේ යැයි අපේක්‍ෂා කෙරේ. එමගින් මහින්ද රාජපක්‍ෂ මහතාගේ ජයග්‍රහණය පලුදු කර හැකි යැයි විජාතික බලවේග සිතනවා විය හැකි ය. අනෙක් අතට ජනාධිපතිවරණයෙන් පරාජය වීමත් සමග ෆොන්සේකා මහතා දේශපාලන වශයෙන් අනාථයකු වනු ඇත. එපමණක් නොව ඔහු ලබා ඇති කීර්තිය අපකීර්තියක් බවට පත්වනු ඇත. ඉතිහාසයේ රන් අකුරින් ලියැවීමට තරම් නමක් තිබූ ෆොන්සේකා මහතා ඉතිහාසයේ කුණු කූඩයට විසිවනු ඇත. විජාතික බලවේග එමගින් අපේක්‍ෂා කරනුයේ එ මහතා ඉතිහාසයේ කුණු කූඩයට යැවීම පමණක් නො වේ. තමන්ගේ සියළු අපේක්‍ෂා සුන්කළ රණවිරුවන් අතර භේදයක් ඇතිකිරීමත් රණවිරුවන් හා ජනතාව අතර සිත් බිඳීමක් ඇතිකිරීමත් බටහිරයන්ගේ බලාපොරොත්තුව වෙයි.

© Prof. Nalin De Silva

සරත් ෆොන්සේකා මහතාගේ අතීත දේශපාලන හිතවත්කම් ගැන මම නො දනිමි. එහෙත් පොදු අපේක්ෂකයා ලෙස ඔහු ඉදිරිපත්වුවහොත් ඔහු සේවය කරන්නේ විජාතික බලවේගවලට බව පැහැදිලි ය. අනෙක් අතට දෙමළ ජාතික සංධානය විසින් ඒ මහතා ප්‍රතික්ෂෙප කෙරී ඇතැයි කියැවේ. අවසානයේ දී මස්සිනාලාගේ සංධානයෙන් ද ඒ මහතා ප්‍රතික්ෂෙප වීමට ඉඩ ඇත. එසේ වුවහොත් ඔහුට පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත් නොවීම පරාජය අත්වනු ඇත. කිනම් අවසානයක් සිදුවිණි ද ඒ සරත් ෆොන්සේකා මහතාගේ යහපතට හේතු නො වේ.

සරත් ෆොන්සේකා මහතා තම හමුදා නිල ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් ඒ අස්වීම පිළිගැනීමට ජනාධිපතිතුමා තීරණය කර ඇතැයි කියවෙයි. ඒ කළ යුත්තකි. එසේ නොකරන්නේ නම් ෆොන්සේකා මහතාගේ අපේක්ෂකත්වයට බියෙන් ජනාධිපතිතුමා ක්‍රියා කර ඇතැයි යන මතයක් ගොඩනැගීමට ඉඩ ඇත. එසේම ඒ මහතාට තරග නොකරන ලෙසට සංඥාදා පෑණවීමේ ද අවශ්‍යතාවක් නැත. සංඥාදාවක් පණවා ඒ මහතා තරගයෙන් ඉවත්කිරීම අනවශ්‍ය වන්නේ ඒ මහතාගේ පරාජය සහතික වන බැවිනි. අනෙක් අතට සංඥාදාවකට අවනත නොවීමේ අවදානම ද වෙයි.

සරත් ෆොන්සේකා මහතා විශිෂ්ට හමුදා මෙහෙයුමක යෙදුණු බවට කිසිදු සැකයක් නැත. එහෙත් ඒ මහතා ප්‍රභාකරන්ගේ මස්සිනාලාගේ පැත්තට ගියහොත් ඒ මහතා දිනා ඇති කීර්තිය දිය වී යනු ඇත. සිංහලයෝ තවත් සිංහලයකුගේ අතීතයට වඩා වර්තනමානය සලකති. ඔවුන් කිසිවකු අගය කරන්නේ ඒ තැනැත්තාගේ අතීතයට වඩා වර්තමානය මත පදනම් වෙමිනි. ෆොන්සේකා මහතා දෙමළ ත්‍රස්තවාදය පරාජය කිරීමේ දී සුවිශේෂ කාර්යභාරයක් ඉටුකළ ද ඔහු අද රනිල් වික්‍රමසිංහ මහතා සමඟ එක්වන්නේ නම් ඔහුගේ අතීත වික්‍රම දෙස ද අපහාසයෙන් බැලීම සිංහලයන්ගේ සිරිත ය. ඒ සිංහල සංස්කෘතිය ය. කිරි කලයට ගොම ටිකක් එකතු කළා වැනිය, උදේ ඉඳන් වතුර ඇදල කලය බින්දා වැනිය ආදී උපහැරණ සිංහලයන් නිර්මාණය කර ඇත්තේ මේ සංස්කෘතික රාමුවෙහි ය.

අද සරත් ෆොන්සේකා මහතාට කළ හැකි හොඳම කාර්යය නම් හමුදා නිලයේ ම සිටිමින් දෙමළ බෙදුම්වාදය හා දෙමළ ජාතිවාදය පැරදවීමට ආණ්ඩුවට සහාය දීම ය. ආණ්ඩුව සමග යම් විරසයක් ඇති වී තිබෙන්නේ නම් ඒ මහතාට නිලයෙන් අස් වී ආණ්ඩුව විවේචනය කරන අතර ආණ්ඩුවට විරුද්ධ නොවී සිටිය හැකි ය. අවශ්‍ය නම් හමුදා රාජකාරිවලින් අස්වී ජනාධිපතිවරණයේ දී මහින්ද රාජපක්ෂ මහතාට සහාය දිය හැකි ය. එවැනි ක්‍රියාමාර්ගයකින් ඒ මහතාගේ කීර්තිය තවත් වැඩිවනු ඇත. මේ ආණ්ඩුවේ සියළු ක්‍රියා කොන්දේසි විරහිතව ආරක්ෂා කිරීම අපේ ද ප්‍රතිපත්තිය නො වේ. එහෙත් ජනාධිපතිවරණයේ දී කොන්දේසි විරහිතව මහින්ද රාජපක්ෂ මහතාට සහාය දීම අපේ ප්‍රතිපත්තිය වෙයි.

එළාර රජු පැරදවීමෙන් පසුව නන්දිමිත්‍ර සෙනෙවි ගැමුණු කුමරු පළවා හැර රජකම ගැනීමට ඉදිරිපත් වී නම් හෝ පසුව පැමිණි දීඝජන්තු සමග එකතු වී ගැමුණු රජු පැරදවීමට ක්‍රියා කෙළේ නම් හෝ කුමක් සිදුවිය හැකිව තිබිණි ද? නන්දිමිත්‍ර සෙනෙවි එසේ කිරීමට කිසිදාක නොසිතන්නට ඇත. එහෙත් යම් අයුරකින් කාගේ හෝ බහකට මුළා වී එසේ කෙළේ නම් ඒ නන්දිමිත්‍ර සෙනෙවිගේ අවසානය වීමට තිබිණි. එසේ කෙළේ නම් නන්දිමිත්‍ර නාමය ඉතිහාසයෙන් මැකී යනු ඇත්තේ සද්ධාතිස්ස රජු කාලයේ දී ය. මහාවංස කරතෘ මහානාම හිමියන්ට වුව ද අහම්බයකින් නමුත් නන්දිමිත්‍ර සෙනෙවි කෙනකු ගැන සඳහන් කරන්නට වී නම් ඒ වීරයකු ලෙස නොව ද්‍රෝහියකු ලෙස ය.

සරත් ෆොන්සේකා මහතාට ජාතික බලවේග හා විජාතික බලවේග අතර වෙනස හඳුනාගැනීමේ අපහසුතාවක් තිබිය නො හැකි ය. හමුදා නිලධාරීන්ට හොඳ පාලකයන් වීමට හැකි ද යන්න මෙහි දී අපේ ප්‍රශ්නය නො වේ. සරත් ෆොන්සේකා මහතා ජනාධිපති ධුරයට නුසුදුසු යැයි අපි නො කියමු. යම් අයුරකින් සරත් ෆොන්සේකා මහතා ජාතික කඳවුරෙන් රනිල් වික්‍රමසිංහ මහතාට හෝ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට හෝ එරෙහිව තරග වැදිණි නම් අපේ මනාපය ෆොන්සේකා මහතාට ය. එහෙත් අද ඒ මහතා විජාතික කඳවුරෙන් මහින්ද රාජපක්ෂ මහතාට එරෙහිව තරග වැදීමට සූදානම් වෙයි. එහි දී ෆොන්සේකා මහතාට සිංහලයන්ගෙන් විශාල බහුතරයක් විරුද්ධ වනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva